# වේගවත් වර්ධනයක් සඳහා සහභාගීත්වය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
2007

# පටුන


| | | |
|---|---|---|
| 1 | **විදේශ සම්පත් පිළිබඳ සමස්ත විග්‍රහය** | 1 |
| 1.1 | දස අවුරුදු සංවර්ධන සැලැස්ම සහ විදේශීය සංවර්ධන ආධාර | 3 |
| 1.2 | විදේශ ආධාර එකඟතාවයන් හා උපයෝජනයන් | 5 |
| 1.3 | විදේශ ණය ප්‍රමාණය | 11 |
| 1.4 | විදේශ ආධාර උපයෝජනයේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ගෙන ඇති නව ක්‍රියා මාර්ග | 17 |
| 2 | **සංවර්ධණ සහයෝගීතාව සඳහා විදේශ ආධාර ව්‍යාපෘති** | 19 |
| 2.1 | **යටිතල පහසුකම් සංවර්ධනය** | 19 |
| 2.1.1 | මහාමාර්ග හා පාලම් | 21 |
| 2.1.2 | විදුලි බල හා බල ශක්ති | 33 |
| 2.1.3 | වරාය සංවර්ධනය | 39 |
| 2.1.4 | ජලසම්පාදන හා සනිපාරක්ෂාව | 43 |
| 2.1.5 | දුම්රිය මාර්ග සංවර්ධනය | 54 |
| 2.2 | **මානව සම්පත් සංවර්ධනය** | 56 |
| 2.2.1 | අධ්‍යාපන හා නිපුනතා සංවර්ධනය | 57 |
| 2.2.2 | සෞඛ්‍ය | 65 |
| 2.2.3 | විදේශ පුහුණු | 70 |
| 2.3 | **කෘෂිකර්මය, කර්මාන්ත, පරිසර සුරැකීම හා ස්වාභාවික සම්පත් කළමනාකරණය** | 71 |
| 2.3.1 | කෘෂිකර්ම සංවර්ධනය | 72 |
| 2.3.2 | කර්මාන්ත සංවර්ධනය | 77 |
| 2.3.3 | ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ පරිසරය සුරැකීම | 80 |
| 2.4 | **යහ පාලනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සහ පසුවිපරම්** | 86 |
| 2.5 | සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු | 93 |
| 2.6 | වෙනත් අංශ | 104 |
| 2.6.1 | විද්‍යා, තාක්ෂණික, පර්යේෂණ හා සංවර්ධන | 105 |
| 2.6.2 | කලා, සංස්කෘතික, ආගමික සහ සංචාරක | 107 |
| 3 | **පසුබෑමට ලක්ව ඇති ප්‍රදේශ සංවර්ධනය සහ දිළිඳු හිතකාමී, වර්ධන හිතකාමී මූලාරම්භක පියවර** | 111 |
| 4 | **ඉදිරි මූලාරම්භක පියවර - විදේශ ආධාර යටතේ ප්‍රධාන ව්‍යාපෘති** | 125 |

ඇමුණුම්


| | | |
|---|---|---|
| ඇමුණුම 1 | 2007 ජනවාරි 01 සිට 2007 සැප්තැම්බර් 30 දක්වා අත්සන් කරන ලද විදේශ ණය ආධාර සහ ප්‍රධාන ගිවිසුම් ............ | 135 |
| ඇමුණුම 2 | විදේශ ණය/ප්‍රදාන සඳහා එකඟතාවන් සහ වැයයෝජනයන් 2007 ........................................................ | 137 |
| ඇමුණුම 3 | විදේශ ආධාර යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් - 2007 | 139 |
| ඇමුණුම 4 | 2007-10 කාලය තුළ විදේශ ආධාර එකඟතාවයන් සහ උපයෝජනයන් ..................................... | 151 |
| ඇමුණුම 5 | 2007 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 වනදා දක්වා ප්‍රදානය කරන ලද පුහුණු අවස්ථා ....................................... | 160 |
| ඇමුණුම 6 | 2007 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 වනදා දක්වා ඒ ඒ අමාත්‍යාංශයන්ට සහ ආයතනයන්ට ලබාදුන් පුහුණු අවස්ථා .... | 162 |

# හැඳින්වීම

රජය විසින් වෙන්කළ හැකි නිත්‍ය මුදල් ප්‍රමාණය හා අපේක්ෂිත ප්‍රාග්ධන වියදම් අතර අය වැය සීමාකාරක හේතුකොට ඇතිවන පරතරය පියවීමට බෙහෙවින් ඉවහල් වන විදේශාධාර, ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයෙහි ලා සුවිශේෂ කාර්යභාරයක් උසුලයි. විදේශ සම්පත් ප්‍රශස්ථ මට්ටමින් උපයෝගී කර ගැනීම පිණිසත් ඒවා ඵලදායි අන්දමින් උපයෝජනය කිරීම සහතික වීම උදෙසාත් වසර ගණනාවක් පුරා රජය මගින් විවිධ පියවර ගෙන ඇත. රජය විසින් හඳුනා ගනු ලැබූ ප්‍රධාන අංශ අරමුණු කර ගත් සංවර්ධන කියාවලින් ආරම්භ කිරීම, විදේශ ආධාර මගින් පූර්ණ වශයෙන් ඉටුවන පරිදි සංවර්ධන හවුල්කරුවන් ඇතුළු සියළුම පාර්ශවකරුවන්ගේද සහභාගීත්වය ඇතිව " දස අවුරුදු ඉදිරි දැක්ම 2006/2016 සංවර්ධන කාර්ය රාමුව" නම් වූ රජයේ මධ්‍ය කාලීන සංවර්ධන වැඩ සටහන සැකසීම එවැනි එක් වැදගත් ආරම්භක පියවරකි.

ඉදිරි කාලයේදී මූල්‍යනය සඳහා සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීමේදී රජයේ මධ්‍ය කාලීන සංවර්ධන වැඩ සටහන තුළ හඳුන්වා දී ඇති ජාතික ප්‍රමුඛතා සම්බන්ධයෙන් සංවර්ධන පාර්ශවකරුවන් දැනුවත් වන පරිදි " දස අවුරුදු ඉදිරි දැක්ම - 2006 /2016 සංවර්ධන කාර්ය රාමුව" අවසන් කිරීම සඳහා එයට සහභාගීත්වය දක්වන සියළුම සංවර්ධන හවුල්කරුවන් සමග විස්තිරණ උපදේශන ක්‍රියාවලියක නිරත වීමට 2007 ජනවාරි මස ගාල්ලේදී පවත්වන ලද "ශ්‍රී ලංකා සංවර්ධන සමුළුව 2007" මගින් රජයට මහඟු අවස්ථාවක් ලබා දුනි. අතීතයේදී ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති තුලින් උගත් පාඩම් පාදක කොට සමස්ථ වශයෙන් රටේ එක හා සමාන සංවර්ධනයක් ඇති කිරීම සහතික වනු පිණිස, නිශ්චිත ප්‍රතිපල තව තවත් ප්‍රවර්ධනය කරන අතර විශේෂයෙන් ඌන සංවර්ධිත ප්‍රදේශවල වර්ධන අපේක්ෂාවන් ළඟාකර දීමේදී ඇති වන සීමාකාරක දුර්වලතා හා ප්‍රමාද දෝෂයන් සැලකිල්ලට ගනිමින් නව සංවර්ධන ක්‍රමවේද සකසන ලදී.

රටේ සංවර්ධන ආරම්භක පියවරවල ප්‍රතිලාභ, ඌන සංවර්ධිත ප්‍රදේශවලට ප්‍රමාණවත් ලෙස ලැබී නොමැති බැවින් එකී ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධව මධ්‍ය කාලීන සංවර්ධන වැඩ සටහනෙහි සුවිශේෂී වශයෙන් අවධාරණය කර ඇත. 2004 වසරේදී ඇති  වූ සුනාමි ව්‍යසනයෙන් මෙම පසුගාමී ප්‍රදේශවල තත්වය තව තවත් උග්‍ර විය. මෙම ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේ ක්‍රියාවලියේ එක් අංශයක් වශයෙන් විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති කීපයක් මේ වන විටත් මෙම ප්‍රදේශවල ක්‍රියාත්මක කෙරේ. පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමත් සමග ආර්ථික කටයුතු කඩිනම් කිරීම තුළින් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවේ.

සංවර්ධන පාර්ශවකරුවන් රජයේ මෙකී ආරම්භනයන්ට ඉතා දිරිගන්නාසුළු අන්දමින් ප්‍රතිචාර දක්වා ආධාර ලබා දී ඇත. 2007 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාල පරාසය තුළ මධ්‍යකාලීන සංවර්ධන වැඩ සටහන තුළ හඳුනාගනු ලැබූ ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 945 ක එකඟතා ලබා ගැනීමට දැනටමත් රජය සමත් වී ඇත. ඇ.ඩො. මිලියන 307 ක මූල්‍ය සම්පාදනයක් අවශ්‍ය හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළු විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කීපයක් මූල්‍යනය කිරීමේ කටයුතු වසර අවසානයට පෙර අවසන් කිරීමට අපේක්ෂිත අතර, වාර්ෂික එකඟතා ඇ.ඩො. මිලියන 1,250 අභිබවා යනු ඇත.  2006 වසරේ එකඟතාවන් ප්‍රමාණය ඇ. ඩො. මිලියන 1,293 ක් වූ අතර, වසර 3 සිට 5 දක්වා කාල පරාසය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත විවිධ සංවර්ධන ව්‍යාපෘති

සඳහා එම එකඟතාවන් ලබා දෙන ලදී. 2007 වසරේ සැප්තැම්බර් අග වන විට උපචිත වැය යෝජනය නොවූ ශේෂය ඇ. ඩො. බිලියන 4.57 කි.

ශ්‍රී ලංකාවේ විදේශ ආධාර උපයෝජනය කර ඇති ආකාරය විදේශ ආධාර උපයෝජනය කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතින දැවැන්ත යටිතල පහසුකම් ව්‍යාපෘති පිළිබඳ විස්තර, ඒවා ඵලදායි ලෙස උපයෝජනය කිරීමේදී

මුහුණ පෑමට සිදුවන අභියෝග, සහ මහින්ද චින්තනයේ නව ශ්‍රී ලංකාවක් සඳහා ඉදිරි දැක්ම තේමාව යටතේ සඳහන් කර ඇති සංවර්ධන ක්‍රමෝපායන්ට අනුගත වන ආකාරයෙන් දළ දේශීය නිෂ්පාදිතය සියයට 8ක් ඉක්මවන වර්ධන වේගයක් කරා කඩිනම් කිරීමෙහිලා එකී අභියෝග ජය ගැනීමට රජය විසින් ගෙන ඇති මූලාරම්භන මෙම ප්‍රකාශනයෙන් ගෙන හැර දක්වයි.